# ඇතා හා ස්වස්ථික කාසියේ සංකේත මඟින් නිරූපිත අදහස

ඒ.එම්.එන්.කේ. අබේසිංහ[1]

ක්‍රිස්තු පූර්ව තුන් වැනි සියවසේ සිට වර්තමානය දක්වා අවුරුදු දෙදහසකට අධික කාලයක් ශ්‍රී ලංකාව තුළ කාසි භාවිත කළ බවට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක තිබේ. කාසි අනුසාරයෙන් සමකාලීන ආර්ථික පසුබිම පමණක් නොව ආගමික, සමාජීය, දේශපාලනික, සංස්කෘතික ලක්ෂණයන් ද හඳුනාගත හැකිය. අනුරාධපුර යුගයේ දී භාවිත කරන ලද කාසි අතර ස්වස්ථික කාසි වූ කලී කලාත්මක ලක්ෂණවලින් අනූන කාසි විශේෂයකි. ඒ අතර ඇතා හා ස්වස්ථික කාසි වඩාත් වැදගත් වේ. ඇතා හා ස්වස්ථික කාසි සමකාලීන සමාජ නිරූපිතයක් ද යන ගැටළුවට අදාළව කාසියේ තෝරාගත් සංකේත කිහිපයක් ආශ්‍රයෙන් විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. ලිඛිත මූලාශ්‍රය සහ ද්‍රව්‍යාත්මක සාධක මත පදනම්ව මෙම අධ්‍යයනය සිදු කරන ලදී. අනුරාධපුර යුගයේ දී භාවිත ඇතා හා ස්වස්ථික කාසි මඟින් සමකාලීන සමාජයේ ආර්ථිකය පිළිබඳ විමර්ශනය සිදුකර ඇතත් එහි සංකේත මඟින් නිරූපණය සමාජීය පසුබිම පිළිබඳව විමර්ශන සිදු වී ඇත්තේ අල්ප වශයෙනි. ඇතා හා ස්වස්ථික කාසියේ කාලනිර්ණය පිළිබඳ මතවාද පවතින අතර මෙහි අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ සංකේත කිහිපයක් දක්නට ලැබේ. අභිමුඛයේ ගමන් කරන ආකාරයේ ඇත් රුවක්, කඳු සලකුණක්, ස්වස්ථිකයක්, සතරැස් කොටුවක් සහිත වෘක්ෂයක්, පරිපථය සහ තිත් තුන යන සංකේත වේ. ඇතා හා ස්වස්ථික කාසියේ ප්‍රතිමුඛයේ එක් රේඛාවකින් වට කරන ලද අවකාශය මධ්‍යයේ ස්වස්ථිකය, එකට බැඳුණු තුන්කොන් සළකුණ, නන්දි පාදය, කඳු සලකුණ සහ අංකුසය යන සංකේත දැක් වේ. මෙම සංකේත පිළිබඳ බොහෝ විද්වතුන් විවිධ මත පල කර ඇත. ඒ අනුව මෙම කාසියේ සංකේත මඟින් බෞද්ධ මුහුණුවරක් නිරූපණය වන බවත්, දේශපාලන තත්ත්වයන් නිරූපණය වන බවටත් මතවාද ඉදිරිපත් වී ඇත. අතීතයේ ඇතා මංගල වස්තුවක් ලෙස සලකන ලදි. සතරැස් කොටුවක් සහිත වෘක්ෂය බෝ ගසක් ලෙස උපකල්පනය කළ හැකිය. ඒ අනුව ඇතා හා ස්වස්ථික කාසිය සමකාලීන ආර්ථිකය පමණක් නොව සමකාලීන සමාජ තත්ත්වය ද නිරූපණය කරන බව එහි අභිමුඛයේ සහ ප්‍රතිමුඛයේ මුද්‍රිත සංකේත විමර්ශනය තුළින් තහවුරු වේ.

**ප්‍රමුඛ පද :** ඇතා හා ස්වස්තික කාසි, කලාත්මක, සංකේත, සමකාලීන සමාජය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. nadeekaabesinghe21@gmail.com